## ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - 2016/2017

-----------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි ("සමාගම") 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණයේ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණයේ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.1.1 කරුණු අවධාරණය කිරීම

--------------------------------

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මා විසින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 28 හි සඳහන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

### 2.1.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

කෙසේ වුවද, 2017 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම්, එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය අනුව සමාගම විශාල ප්‍රාග්ධන ඌනතාවයකට මුහුණ දී සිටින බවත් සැලකිල්ලට ගත යුතු වේ. මෙම තත්ත්වය අවම කිරීම සඳහා, සමාගම විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි පැහැදිලි කෙරේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම විසින් එහි වත්කම් භාවිතයට සුදුසු දිනය නොසළකා එම වත්කම් මිලදී ගත් මාසයේ පළමු දිනයේ සිට ක්ෂය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂයවීම රු.1,033,846 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත කාලය සඳහා තථ්‍ය බදු වගකීම රු.5,067,235 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 4,975,019 ක් වශයෙන් දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු සඳහා වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශනවල රු. 92,216 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3** **නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 9.2 (ඉ) වගන්තිය | සමාගමේ සංවිධාන සටහන සහ කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 9.3.1 (i) වගන්තිය | සමාගමේ බඳවාගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය සඳහා අදාළ අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව මත අනුමැතිය ලබා දී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 237(ආ) | ගබඩා සඳහා ගෙවීම් කිරීමට පෙර, භාණ්ඩ ලැබී ඇති බවටද, අදාළ බඩු ලේඛනයෙහි තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට ද සහතිකයක් ඇමිණිය යුතුයි. කෙසේවෙතත්, දේශීය මිලදී ගැනීම් 08 කින් රු. 14,705,584 ක් වටිනා භාණ්ඩ ගබඩාවට ලැබීමට පෙර සියයට 50 ත් සියයට 70 ත් අතර පරාසයක වූ අත්තිකාරම් සමාගම විසින් ගෙවා තිබුණි. |

**3** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.131,961,978 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.144,708,235 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,746,257 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ දී පේටන්ට් බලපත්‍ර අලවියෙන් ලද ආදායම, මූල්‍ය ප්‍රතිඵලයේ මෙම සුළු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, 2017 මාර්තු 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු. 778,477,641 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී මෙය රු. 106,905,072 කින් වැඩිවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණයේදී, 2012/2013 වර්ෂයේ සිට අඛණ්ඩ ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණි. කෙසේවෙතත්, සේවක පාරිශ්‍රමික, රජයට ගෙවන ලද බදු සහ ජංගම නොවන වත්කම් ක්ෂයවීම පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, 2014/2015 වර්ෂයේදී හැර, සමාගම සඳහා අගය එකතු කිරීමේදී, හිතකර තත්ත්වයක් බලාපොරොත්තු විය හැකිය.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, අපේක්ෂිත ඉලක්ක සහ පෞද්ගලික පාර්ශවයන්ගේ අරමුදල්වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා වෙන්කිරීම් එහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) මාස 05 සහ 06 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ කාලසීමාවන් සඳහා සමාගම විසින් පෞද්ගලික සමාගම් දෙකක් සමඟ පර්යේෂණ ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව, එම පෞද්ගලික සමාගම් විසින් රු.3,091,693 ක මුදලක් මෙම කාර්යය වෙනුවෙන් සමාගමට ගෙවා තිබුණි. කෙසේවෙතත්, ගිවිසගත් කාල සීමාව තුළදී ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකිවීම මත, සමාගම විසින් මේ සම්බන්ධයෙන් රු. 4,446,321 ක අමතර පිරිවැයක් දරා තිබුණි.

(ඇ) සමාගම විසින් රජයේ අරමුදල්වලින් රු. මිලියන 79 ක පිරිවැයක් දරා ඉල්මනයිට් සහිත වැලිවලින් ටයිටේනියම් නිස්සාරණය කර ගැනීම සඳහා අවම පිරිවැයක් සහිත සඵලදායී ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් සාර්ථකව නිම කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉහත ව්‍යාපෘතියේ ප්‍රතිඵල දේශීය, වශයෙන් හෝ අන්තර්ජාතික වශයෙන් වාණිජකරණය කිරීමට සමාගමට නොහැකිවිය.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 10,225,266 ක් වටිනා උපකරණ මිලදී ගැනීම සඳහා 2016 සැප්තැම්බර් 20 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේවෙතත්, 2018 අප්‍රේල් අවසානය දක්වාම එම උපකරණ මිලදී ගැනීමට සමාගම අසමත් වී තිබුණි.

(ආ) සමාගම විසින් ජීව විද්‍යාගාරයේ භාවිතය සඳහා රු,17,510,343 ක් වටිනා උපකරණ 16 ක් මිලදී ගෙන තිබුණි. කෙසේවෙතත්, 2018 පෙබරවාරි අවසානය වනවිටත් එම උපකරණ සවි කර ජීව විද්‍යාගාරය පිහිටුවා නොතිබුණි. එබැවින්, එම උපකරණ නිෂ්ක්‍රීයව තබා තිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| ---------------- | -------------- |
| (අ) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | ගිණුම්වල දීර්ඝ කාලීන හිඟ හිටි ශේෂ අය කර ගැනීමකින් තොරව පැවතුනි. |
| (ආ) බදු කළමනාකරණය | ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ඇ) ගෙවීම් පාලනය | වෙනස්කළ ගෙවීම් වවුචර සහ අනුපිටපත් වවුචර අංක පැවතුණි |